# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2006 අංක 15 දරන බැංකු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2006 මාර්තු මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


2006 මාර්තු මස 31 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ :** රු. 6.75 යි. **තැපැල් ගාස්තුව :** රු. 5.00 යි.

# 2006 අංක 15 දරන බැංකු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2006 මාර්තු මස 31 වන දින]

එල්. ඩී. —ඕ. 14/2006

## 1988 අංක 30 දරන බැංකු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

**1**. මේ පනත 2006 අංක 15 දරන බැංකු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 30 දරන බැංකු පනතේ 19 වන වගන්තිය, එහි (3) (අ) උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:– 1988 අංක 30 දරන පනතේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

(i) බලපත්‍රලාභී වාණිජ බැංකුවක තැන්පතු වගකීම් හෝ ආපතික වගකීම් ඇතුළු මුළු වගකීම් හෝ මුළු වත්කම් හෝ යම් නිශ්චිත වත්කම් වර්ගයක්; නැතහොත්

(ii) බැංකු ක්‍රමයේ ශක්තිමත් භාවය සහ ස්ථාවර භාවය සහ ජාතික ආර්ථිකයේ යහපත,

සැළකිල්ලට ගෙන මේ වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් පවත්වාගෙන යාමට නියමිත අවම ප්‍රමාණය වශයෙන් නිශ්චිතව දක්වා ඇති මුදල් ප්‍රමාණයන් මුදල් මණ්ඩලය විසින් කලින් කළ වෙනස් කරනු ලැබිය හැකි ය.

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ (ii) වන අනුඡේදයේ (ඇ) වාක්‍යාංශය වෙනුවට පහත දැක්වෙන අලුත් වාක්‍යාංශය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :– ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඇ) අවස්ථාවෝචිත පරිදි පුද්ගලයකු හෝ සමාගමක්, කෙලින්ම හෝ අන්‍යාකාරයෙන් හෝ ප්‍රතිලාභ වශයෙන් යම් එක් එක් සමාගම්වල සැහෙන සම්බන්ධතාවයක් හෝ වැදගත් කළමණාකරන සම්බන්ධතාවයක් දරන්නේ ද, එවැනි සමාගම් විසින්,";

ප්‍රධාන ප්‍රඥප්තියේ 76උ වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 76උ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:–

"බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය පවත්වාගෙන යා යුතු බව.

76 උ. (1) (3) වන උපවගන්තියේ විධිවිධානයන්ට යටත්ව, සෑම බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් ම, රුපියල් මිලියන පනහකට නොඅඩු හෝ මුදල් මණ්ඩලය විසින් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, බැංකු ක්‍රමයේ ශක්තිමත් භාවය සහ ස්ථාවර භාවයත්; ජාතික ආර්ථිකයේ යහපතත් සැලකිල්ලට ගෙන කලින් කළ නිශ්චය කරනු ලැබිය හැකි යම් වෙනත් ප්‍රමාණයක හෝ කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනයක් සෑම කල්හි ම පවත්වාගෙන යා යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා "කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය" යන්නට 19 වන වගන්තියේ (2) වන උපවගන්තිය මගින් ඊට ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

(3) (අ) (i) බලපත්‍රලාභී විශේෂිත බැංකුවක තැන්පතු වගකීම් හෝ ආපතික වගකීම් ඇතුළු මුළු වගකීම් හෝ මුළුවත්කම් හෝ යම් නිෂ්චිත වත්කම් වර්ගයක්; නැතහොත්

(ii) බැංකු ක්‍රමයේ ශක්තිමත්භාවය සහ ස්ථාවරභාවය සහ ජාතික ආර්ථිකයේ යහපත,

සැලකිල්ලට ගෙන මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය වශයෙන් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් පවත්වාගෙන යාමට නියමිත අවම ප්‍රමාණය වශයෙන් නිශ්චිතව දක්වා ඇති මුදල් ප්‍රමාණයන් මුදල් මණ්ඩලය විසින් කලින් කළ වෙනස් කරනු ලැබිය හැකි ය ;

(ආ) අවම නියමිත කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය වගකීම්වලට හා වත්කම්වලට අදාළ වන සේ නියම කරනු ලබන කල්හි, එය ගණන් බැලීමේ කාර්ය සඳහා ප්‍රාග්ධනය සහ වගකීම් යන දෙකම හෝ වත්කම්, ජාතික ආර්ථිකයේ යහපත සැලකිල්ලට ගෙන, මුදල් මණ්ඩලය විසින් කලින් කළ තීරණය කරන පරිදි වූ වර්ගයක සහ ගණන් බැලීමේ ආකාරයක විය යුතු ය ;

(ඈ) බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් පවත්වාගෙන යාමට නියමිත කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය විසින් සිදු කරන ලද යම් වෙනසක් පිළිබඳව මුදල් මණ්ඩලය විසින් ලිඛිතව සියලුම බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට දැනුම් දිය යුතු ය ;

(ඇ) එම වෙනස් කිරීම මගින් ස්වකීය කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය වැඩි කිරීමට යම් බලපත්‍රලාභී විශේෂිත බැංකුවකට නියම කරනු ලබන අවස්ථාවක එම බැංකුව විසින් මුදල් මණ්ඩලය වෙත කරනු ලබන ඉල්ලීමක් මත ඉහත කී නියමයට අනුකූලව ක්‍රියා කිරීම සඳහා මාස දොළහක කාලයක් හෝ මුදල් මණ්ඩලය විසින් ප්‍රදානය කරනු ලබන වඩා දීර්ඝ කාලයක් ලබා දිය යුතු ය.

(4) යම් ලිඛිත නීතියක් මගින් හෝ එය යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් සම්බන්ධයෙන් වන විට එම බැංකුවේ ප්‍රාග්ධනයේ විදේශීය සහභාගිත්වයේ සීමාව කිසිදු අවස්ථාවක දී මුදල් මණ්ඩලය විසින් කලින් කල ස්ථාපනය කරනු ලබන සීමාව නොඉක්මවිය යුතු ය.

(5) මුදල් මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමතිය නොමැතිව බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් එහි කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය අඩු නොකල යුතු ය.

(6) බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් එහි යම් නොගෙවූ ප්‍රාග්ධනය මත යම් අයභාරයක් ඇති නොකළ යුතු අතර, මේ විධිවිධාන කඩකරමින් ඇති කරන ලද යම් අයභාරයක් ශූන්‍ය සහ බලරහිත වේ.

(7) (අ) සෑම බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින්ම සෑම කල්හිම මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාතයක් පවත්වාගෙන යා යුතු අතර එසේ පවත්වා ගෙන යා යුතු අනුපාතය තීරණය කිරීමේ දී

මුදල් මණ්ඩලය විසින් ප්‍රායෝගිකව සිදු කල හැකිතාක් දුරට බාසල් හි 'බැන්ක් ෆෝ ඉන්ටර්නැෂනල් ෙට්ල්මන්ට්ස්' බැංකුව විසින් දක්වා ඇති ප්‍රාග්ධන ප්‍රමාණවත් බව සඳහා වූ නියමු උපදෙස් පිළිපැදිය යුතු ය ;

(ආ) (අ) ඡේදයේ සඳහන් ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාතයෙහි යම් වෙනස්කමක් පිළිබඳව මුදල් මණ්ඩලය විසින් සෑම බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වෙතම ලිඛිතව දැනුම් දිය යුතු ය :

එසේ වුව ද, එම වෙනස් කිරීම මගින් ස්වකීය ප්‍රාග්ධනය වැඩි කිරීමට නියමව ඇති සෑම බලපත්‍රලාභී විශේෂිත බැංකුවකට ම එම නියමයට අනුකූලවීම සඳහා මාස 12 කාලයක් හෝ මුදල් මණ්ඩලය විසින් ප්‍රදානය කරනු ලබන වඩා දීර්ඝ කාලයක් ලබා දිය යුතු ය.

(8) ඉහතින් වූ උපවගන්තිවල විධිවිධාන ප්‍රකාරව බලපත්‍රලාභී විශේෂිත බැංකුවක කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය හෝ ප්‍රාග්ධන අරමුදල් අඩු වී ඇති අවස්ථාවක ඒ අඩුවීම නිවැරදි කිරීම සඳහා මුදල් මණ්ඩලය විසින් සාධාරණ කාලසීමාවක් ලබා දිය යුතු ය.".

76උ වගන්තියේ විධිවිධාන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවලට අදාළ නොවන බව.

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 76උ වගන්තියේ අන්තර්ගත කිසිවක් 1997 අංක 6 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ පිහිටුවනු ලැබූ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවකට අදාළ වන බවට තේරුම් නොගත යුතු ය :

එසේ වුව ද, ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට අදාළව ප්‍රාග්ධන අවශ්‍යතාවල අදාළ සීමාවන් මුදල් මණ්ඩලය විසින් කලින් කළ තීරණය කරනු ලැබිය හැකි ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 76ඵ වගන්තිය සංශෝධනය කිරීම.

**6**. 2005 අංක 2 දරන පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 76ඵ වගන්තිය, එහි (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) එහි 'ට' ඡේදයේ (II) (ආ) (ඌඌ) උපඡේදය ඉවත් කිරීමෙන් ;

(2) එහි 'ට' ඡේදයේ (II) වන උපඡේදයේ, (ආ) වාක්‍යාංශයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :–

"(ඇ) අවස්ථාවෝචිත පරිදි පුද්ගලයකු හෝ සමාගමක් කෙලින්ම හෝ අන්‍යාකාරයෙන් හෝ ප්‍රතිලාභ වශයෙන් හෝ යම් එක් එක් සමාගම්වල සැහෙන සම්බන්ධතාවයක් හෝ වැදගත් කළමණාකරන සම්බන්ධතාවයක් දරන්නේ ද, එවැනි සමාගම්:".

අතීතයට බලපෑම.

7. මේ පනත ක්‍රියාත්මක වීමට පෙර කවර හෝ අවස්ථාවක දී ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය හෝ 76උ වන වගන්තිය යටතේ සාදන ලද හෝ නිකුත් කරන ලද යම් නිශ්චයක් කිරීමක්, තීරණයක් හෝ විධානයක්, පිළිවෙලින් මේ පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය හෝ 76උ වගන්තිය ප්‍රකාරව වලංගු ලෙස සාදනු ලැබ හෝ නිකුත් කරනු ලැබූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු අතර, එම නිශ්චය කිරීම, තීරණය හෝ විධානය යටතේ ගන්නා ලද යම් ක්‍රියාමාර්ගයක් ඒ අනුව වලංගු ලෙස සළකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

8. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.